# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1984 අංක 26 දරන

# බ්ලූමැන්ඩල් සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

**[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 21 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1984 ජූනි මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 60 යි

තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 26 දරන බ්ලූමැන්ඩල් සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූනි මස 21 වන දින.]

එල්. ඩී. —ඕ. 57/82.

**බ්ලූමැන්ඩල් සංවර්ධන සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

**පූර්විකාව.**

"බ්ලූමැන්ඩල් සංවර්ධන සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන සහ සඳහන් කරනු ලබන සමිතියක් ඒ සමිතියේ සාමාජිකයන් එකඟ වූ රීතිවලට අනුකූලව, එකී සමිතියට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ ඉටු කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් කොළඹ පිහිටුවා තිබුණු හෙයින් ද:

ඒ සමිතිය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ සහ කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු ඒ සමිතිය විසින් මේ දක්වා සාර්ථකව ක්‍රියාත්මක කර සහ ඉටු කර ඇති අතර, ඒ සමිතිය සංස්ථාගත කිරීමට ඉල්ලා ඇති හෙයින් සහ ඒ ඉල්ලීමට ඉඩදීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1984 අංක 26 දරන බ්ලූමැන්ඩල් සංවර්ධන සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**බ්ලූමැන්ඩල් සංවර්ධන සමිතිය සංස්ථාගත කිරීම.**

2. මේ පනත ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) බ්ලූමැන්ඩල් සංවර්ධන සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින සියලු තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු සාමාජිකයන් වශයෙන් ඇතුළත් කර ගනු ලබන වෙනත් තැනැත්තන් "බ්ලූමැන්ඩල් සංවර්ධන සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවක් බවට පත් විය යුතු අතර, එම සංස්ථාපිත නාමයෙන් එය විසින් හා එයට විරුද්ධව සියලු අධිකරණයන්හි නඩු පවරනු ලැබිය හැකි ය. තව ද පොදු මුද්‍රාවක් තබාගෙන එය පාවිච්චි කිරීමේ ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ හෝ අලුතින් කිරීමේ ද පූර්ණ බලය සහ අධිකාරය ඒ සංස්ථාවට ඇත්තේ ය.

**සංස්ථාවේ පොදු පරමාර්ථ.**

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ කවර පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ පහත දක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) සාමාන්‍යයෙන් පොදුවේ ද විශේෂයෙන් කොළඹ බ්ලූමැන්ඩල් පාර දෙපස හා ඒ අවට ප්‍රදේශයේ දරිද්‍රතාව සහ ආපදා, සඳහා සහන සැලසීම;

(ආ) එකී ප්‍රදේශයේ පදිංචි ළමයින්ගේ සහ වැඩිහිටියන්ගේ අධ්‍යාපනය සඳහා ආධාර සැපයීම;

(ඇ) එකී ප්‍රදේශයේ පදිංචි තැනැත්තන්ට රැකියා ලබා ගැනීමට සහ රැකියා කරගෙන යාමට ආධාර සැපයීම;

(ඈ) එකී ප්‍රදේශයේ පදිංචි තැනැත්තන්ට සැපයිය යුතු යයි සංස්ථාවට පෙනී යන ප්‍රතිලාභ සහ ආධාර එකී ප්‍රදේශ වාසීන්ට සැපයීම; සහ

(ඉ) සාමාන්‍යයෙන් සංස්ථාවේ පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා අවශ්‍ය හිතකර හෝ ආනුෂංගික වෙනත් සියලු දේ කිරීම.

**සංස්ථාවේ සාමාන්‍ය බලතල.**

4. මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත් ව, බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වාගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදාන හා පරිත්‍යාග ලබා ගැනීමේ ද සිය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සේවක පිරිස් සේවයට ගැනීමේ, සේවයේ නියුක්ත කර ගැනීමේ සහ සේවයෙන් පහ කිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ එම පරමාර්ථ අතුරින් යම් කිසිවක් හෝ වැඩි දියුණු කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය කවර ආකාරයේ වුව ද සියලු ක්‍රියා කිරීමේත් සියලු කරුණු ඉටු කිරීමේ සහ සියලු දේ ක්‍රියාත්මක කිරීමේත් බලය සංස්ථාවට තිබිය යුතු ය.

**සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.**

5. (1) සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇත්තාවූ ද ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කර ගනු ලබන්නාවූ ද නිලධරයන් ගෙන් සහ වෙනත් තැනැත්තන් සංඛ්‍යාවකින් සමන්විත වූ විධායක කමිටුවක් විසින්, සංස්ථාවේ රීතිවලට යටත්ව, සංස්ථාවේ කටයුතු පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන අවස්ථාවේ දී සමිතියේ ධුර දරන විධායක කමිටුව සංස්ථාවේ ප්‍රථම විධායක කමිටුව විය යුතු ය.

**සංස්ථාවේ රීති.**

6. (1) සාමාජිකයන් ඇතුළත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම සඳහා ද විධායක කමිටුවේ සහ සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ සහ අනුයෝජිතයන්ගේ සහ සේවකයන්ගේ කාර්ය කරගෙන යාම සඳහා ද සංස්ථාවේ කටයුතු පිළිබඳව අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සඳහා ද සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සඳහා සහ සංස්ථාවේ පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා ද සංස්ථාව විසින්, කලින් කල යම් විශේෂ මහා සභා රැස්වීමක දී, ඡන්දය දීමට හිමිකම් ඇති සාමාජිකයන්ගේ තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් රීති සාදනු ලැබීම නීත්‍යානුකූල වන්නේ ය. එකී රීති සෑදීමෙන් පසු එවැනි ම රැස්වීමක දී එවැනිම ආකාරයෙන් එකී රීති වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම ද කරනු ලැබිය හැකි ය.

(2) සංස්ථාවේ සාමාජිකයන් සෑමවිට ම සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

**සමිතිය විසින් ගෙවිය යුතු හා සමිතියට අයවිය යුතු ණය.**

7. මේ පනතේ කාර්ය සඳහා මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවේ දී සමිතියෙහි පවත්නා සියලුම ණය හා බැරකම් මෙසින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාව විසින් ගෙවිය යුතු අතර සමිතියට අය විය යුතු සියලුම ණය සහ සමිතිය වෙත ගෙවිය යුතු සියලු දායක මුදල් සහ සම්මාදම් මුදල් සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

**සංස්ථාවේ මුද්‍රාව තැබිය යුත්තේ කෙසේ ද යන වග.**

8. විධායක කමිටුවේ සාමාජිකයන් තිදෙනකු ඉදිරිපිට දී මිස සංස්ථාවේ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට නොතබනු ලැබිය යුතු අතර තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තවද, එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

**සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපළ තබාගත හැකි බව.**

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් බුදල් බැහැර කිරීමක් ප්‍රකාර හෝ අන්‍යාකාරයකින් හෝ සංස්ථාව වෙත සතු වන්නා වූ යම් චංචල හෝ නිශ්චල දේපළක් භාර ගැනීමටත් දැරීමටත් නීතියෙහිලා හැකියාව හා ශක්තතාව සංස්ථාවට ඇත්තේ ය. තව ද එකී සියලු දේපළ, මේ පනතේ කාර්ය සඳහා සහ තත්කාලයේ වලංගුව පවතින රීතිවලට යටත්ව ඒවා විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කර ගැනීමේ හා අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සහිතව සංස්ථාව විසින් දැරිය යුතු ය.

**විසුරුවා හැරීමෙන් පසු ඉතිරි වන දේපළ.**

10. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලුම ණය සහ බැරකම් ගෙවා සමථයකට පත් කරනු ලැබීමෙන් පසු, කවර හෝ දේපළක් ඉතිරි වේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා නොදිය යුතු අතර සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති සහ යම් ආදායමක් හෝ දේපළක් ස්වකීය සාමාජිකයන් අතර බෙදා දීම ස්වකීය රීති මගින් තහනම් කරනු ලැබ ඇත්තා වූ ද වෙනත් යම් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. ඒ සංගමය හෝ සංගම් කවරේ ද යන්න සංස්ථාව විසුරුවා හරින වේලාවේ දී හෝ ඊට පෙරාතුව දී හෝ සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කළ යුතු ය.

**ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.**

11. මේ පනතෙහි සඳහන් තැනැත්තන්ගේ හා ඔවුන් මගින්, ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන්නවුන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තකුගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතෙහි ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1. තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.